# සිංහල

## කියවීම් පොත

## 2 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

| | | |
|---|---|---|
| **පළමුවන මුද්‍රණය** | **-** | **2016** |
| **දෙවන මුද්‍රණය** | **-** | **2017** |
| **තුන්වන මුද්‍රණය** | **-** | **2018** |
| **සිවුවන මුද්‍රණය** | **-** | **2019** |
| **පස්වන මුද්‍රණය** | **-** | **2020** |
| **සයවන මුද්‍රණය** | **-** | **2021** |

ISBN 978-955-25-0227-9

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: State Printing Corporation, Panaluwa, Padukka.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා

ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

පිළිගනු මැන අප භක්ති පූජා

නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා

ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති

ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ

ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා

ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා

එක මවකගෙ දරු කැල බැවිනා

යමු යමු වී නොපමා

ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

'අධ්‍යාපනය' ලෝකය වෙනස් කළ හැකි ප්‍රබලතම අවිය වේ. එසේම පුද්ගලයාට තම ජීවිතයේ යහපත් වෙනස්වීම් සඳහා හැඩගැසීමේ හැකියාව ලබා දෙන්නේ ද අධ්‍යාපනයයි. ඉහළ ගුණාත්මක බවකින් යුතු පෙළපොත් සම්පාදනය කරමින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සැමට අධ්‍යාපනය ලබා දීමේ මාහැඟි මෙහෙවරට උර දී සිටියි.

නිදහස් අධ්‍යාපනයේ අනඟි තිළිණයක් ලෙස ඔබ දෝතට නොමිලේ පිරිනැමෙන මෙම පෙළපොත වටිනා ඉගෙනුම් ආධාරකයකි. ශීඝ්‍රයෙන් වෙනස් වන නව ලෝකය හමුවේ ඇති අභියෝග ජය ගෙන දිරියෙන් නැඟී සිටීමට, ඔබට මෙම පෙළපොත මඟ පෙන්වනු ඇත. පෙළපොත, කියවීමට පමණක් සීමා නොකර, ඒ ඔස්සේ ඔබ සැම තව තවත් දැනුම වර්ධනය කර ගැනීමට උනන්දු විය යුතු ය. යහපත් ලෙස ජීවත් වීමට අවශ්‍ය කුසලතා අත්පත් කර ගත් සාර්ථක පුරවැසියකු වී, අනාගත ලොව දිනන්නට මේ පෙළපොත ඔබට අත්වැලක් වෙතැයි මම අපේක්ෂා කරමි.

පෙළපොත් සම්පාදන කාර්යය සඳහා අගනා දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයේ සැමටත් මාගේ ප්‍රණාමය පුද කරමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2021.05.05

## නියාමනය හා අධීක්ෂණය

| | | |
|---|---|---|
| **පී. එන්. අයිලප්පෙරුම මයා** | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## මෙහෙයවීම

| | | |
|---|---|---|
| **ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි මිය** | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## සම්බන්ධීකරණය

| | | |
|---|---|---|
| **ඩබ්ලිව්. ඩී. පද්මිණි නාලිකා මිය** | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| **ප්‍රගීතිකා ජයසේකර මිය** | - | නියෝජ්‍ය කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## සංස්කාරක මණ්ඩලය

| | | |
|---|---|---|
| **ජේ. බී. දිසානායක මයා** | - | සම්මානිත මහාචාර්ය |
| **එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා** | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම. |
| **ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ මෙය** | - | සහකාර කථිකාචාර්ය,<br>මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම. |

## ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. කරුණාරත්න මයා | - | කථිකාචාර්ය,<br>ගිරාගම ගුරු මධ්‍යස්ථානය,<br>ගිරාගම,<br>පිළිමතලාව. |
| රෝහිණී චිත්‍රලතා මිය | - | ප්‍රාථමික ගුරු උපදේශක,<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>ගිරිඋල්ල, වයඹ පළාත. |
| විපුලි නිරෝෂිණී හෙට්ටිආරච්චි මෙය | - | රාජ්‍ය සම්මාන ලාභී ලේඛිකා<br>(ළමා සාහිත්‍යය) |
| කේ. වී. විමාලි කරුණාරත්න මිය | - | ගුරු සේවය,<br>නාලන්දා විද්‍යාලය,<br>කොළඹ 10. |
| තනූජා නිශාන්ති අයගම මෙය | - | රාජ්‍ය සම්මාන ලාභී ලේඛිකා<br>(ළමා සාහිත්‍යය) |

## චිත්‍ර හා පිටකවර නිර්මාණය

| | | |
|---|---|---|
| අමිල කෝසල උඩවත්ත මයා | - | ගුරු සේවය,<br>නාගොඩ මහා විද්‍යාලය,<br>කළුතර |

## පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම

| | | |
|---|---|---|
| හසල චතුරංග විතානගේ මයා | - | පරිගණක අංශය,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | වැව් ඉවුරේ සංගීත පන්තිය | 1 - 3 |
| 2. | ළමයා හා තාරකා | 4 - 5 |
| 3. | නිධානය | 6 - 9 |
| 4. | ඔංචිලි පදිමු | 10 - 11 |
| 5. | හැමෝම දිනුම් | 12 - 15 |
| 6. | වලාකුළේ | 16 - 17 |
| 7. | අලුත් නුවණ | 18 - 21 |
| 8. | සෙල්ලම් ඉස්කෝලේ | 22 - 23 |
| 9. | අපූරු තෑග්ග | 24 - 26 |
| 10. | කඩදාසි මාළුවෙක් හදමු | 27 - 31 |
| 11. | තෝරාලා කිවුවොත් තරු ලකුණු ලැබෙන්නේ | 32 - 33 |
| 12. | කතන්දරයක් කියවමු | 34 - 37 |
| 13. | වවමු වවමු අපිත් වවමු | 38 - 41 |
| 14. | අම්මා තාත්තා ඉර හඳ වාගේ | 42 - 45 |
| 15. | සතුටු චාරිකාව | 46 - 50 |

"කදිම පින්තූරයි
පාඩම් පෙළත් සාරයි
මෙපොත මට බාරයි
මගේ සිහි නුවණ මින් මෝරයි"

ආනන්ද රාජකරුණා
ළදරු ගී දෙවන ප්‍රමාණය

# 1. වැව් ඉවුරේ සංගීත පන්තිය

යාළුවෝ වැව් ඉවුරට ආවා.

“අද අපි මොනව ද කරන්නේ?”

ජානක ඇසුවා.

“සංගීත පන්තියක් දමමු.” පවනි කිවුවා.

හැමෝම කැමති වුණා.

“මම ගුරුතුමී වෙන්නම්.” මලී අක්කා කිවුවා.



"හෝ ගාලා රැලි එනවා. වැව අද මුහුද වගේ."

කසුන් කිවුවා.

"මුහුදෙ නම් ලොකු නැව් යනවා නේද?"

පවනි නංගි ඇහුවා.

"ඔව්, ඔව්," කවුරුත් හයියෙන් කිවුවා.

"මට ආසයි නැවක යන්න." කෝසල කිවුවා.

"ළමයි, දැන් අපි රවුමට වාඩි වෙමු. මුහුද ගැන සින්දුවක් කියමු."

**මුහුද ලස්සනයි**<br>
**මුහුද හරි ලොකුයි**<br>
**හො හෝ හො හෝ හො හෝ හෝව**<br>
**නතර වෙන්නෙ නෑ**<br>
**රැල්ල ඇදෙනවා**<br>
**වැල්ලෙ වැදෙනවා**<br>
**සමන් මොට්ටු වගේ වතුර බිංදු ඉහෙනවා**



“ මම දන්නවා සරුංගලය ගැන සින්දුවක්. කියන්න ද?” කෝසල ඇහුවා.

සුළං සැරේ වංගු හැරී
දුර අහසේ දාංගලේ
මහන්සියට ගහ මුදුනේ
හැංගුණා ද සරුංගලේ

“හරිම ලස්සනයි. අපි හැමෝම තාලෙට කියමු.”

“ හැන්දෑ වෙන්න ළඟයි. අපි දැන් ගෙදර යමු.”

“ හෙට අපි සරුංගල් යවමු ද?” පවනි ඇහුවා.

හැමෝම කැමති වුණා.

යාළුවෝ සින්දු කිය කියා,


කෝච්චියක් වගේ පේළියට ගෙදර ගියා.



# 2. ළමයා සහ තාරකා

තරු පිරිලා
ආකාසේ
මල් පිපිලා
සේ දිලිසේ.

මහ පුදුමයි
ළිඳ පතුලෙත්
පොකුරු පොකුරු
තරු බබළයි.



පොළොව යටත්
තව අහසක්
තියෙනවා ද
මට පුදුමයි.

මොකද අනේ
තරු පැංචෝ
සීතලේ ද
වෙවුලන්නේ?



# 3. නිධානය

එකෝමත් එක කාලෙක දක්ෂ ගොවියෙක් හිටියා.

මේ ගොවියාට පුත්තු හතර දෙනෙක් හිටියා.

මේ හතර දෙනා හරි ම කම්මැළියි.

පියා හම්බ කරන දේ කාලා ජීවත් වුණා.

පියාට උදවු කළෙත් නැහැ.

ඒ නිසා ගොවිතැන් වැඩත් බැහැ.

කිසි ම දෙයක්

ඉගෙන ගත්තෙත් නැහැ.



කාලයක් ගත වුණා.

පියා ලෙඩ වුණා.

පුත්තු හතර දෙනාට

ජීවත් වෙන්න බැරිව ගියා.

ගොවියා පුතුන් හතර දෙනාට

කතා කළා.

“ කුඹුරේ නිධානයක් තියෙනවා,

කුඹුර කොටන්න. නිධානය ගන්න පුළුවන්.” පියා කිවුවා.



පුත්තු හතර දෙනා නිධානය ගන්න කුඹුර කෙටුවා.
ඒත් නිධානය ලැබුණේ නැහැ.
" නිධානයක් නැහැ." පුත්තු පියාට කිවුවා.
" කුඹුරේ වී වපුරන්න, එවිට නිධානය ලැබේවි."
පියා ඔවුන්ට කිවුවා.

හතර දෙනා ම එකතු වෙලා වී වැපුරුවා.



වී පැළ වුණා. ගොයම් පැහුණා. වී ලැබුණා.

මහන්සි වී වැඩ කළ නිසා,

පුත්තු හතර දෙනා ධනවත් වුණා.

පියාගේ නිධානයේ රහස, ඔවුන්ට තේරුම් ගියා.

ඔවුන් සතුටින් ජීවත් වුණා.



# 4. ඕංචිලි පදිමු.



රබන් සුරල් හඬ මැද්දේ
කොහා හඬයි ගම්මැද්දේ
ගේ ළඟ උස කජු අත්තේ
ඕංචිල්ලාවක් බැන්දේ

කඹය තදින් ගෙන අල්ලා
පරෙස්සමින් වාඩි වෙලා
රුකුල් දෙමින් ඉහළ බලා
පදිමු පදිමු ඕංචිල්ලා





ඔංචිලි චිලි චිල්ල මලේ
වැල්ල දිගට නෙල්ලි කැලේ
කඩන්න බැරි කටු අතුලේ
කඩා දෙන්න මගේ මලේ

වාරම් ගී අක්කාගේ
පුංචි අපට හරිම අගේ
ඔංචිලි චිලි චිල්ල මලේ
ගයමු අපිත් එන්න නගේ

හෙමින් හෙමින් ඉහළ යමූ
ආයෙත් පහළට ඇදෙමූ
රණ්ඩු දබර නොකර තුටින්
හැමෝම ඔංචිලි පදිමූ



# 5. හැමෝම දිනුම්

පාසලේ ක්‍රීඩා උත්සවය අදයි.

හැමෝම තරගවලට සූදානම් වෙලා පාසලට ගියා.

නිවේදනයක් ඇසුණා.

**" කරුණාවෙන් සවන් දෙන්න.**

**කරුණාවෙන් සවන් දෙන්න.**

**දිවීමේ තරගය ආරම්භ කිරීමටයි මේ සූදානම.**

**මෙම තරගය සඳහා සහභාගි වන දෙවන ශ්‍රේණියේ ශිෂ්‍යයන්**

**ආරම්භක ස්ථානයට එන්න."**

" යන්න.. යන්න.. ඉක්මනට යන්න. නිපුන් යන්න. මාධවන් යන්න."

මනුක, රෂීඩ්, සංජය, නිපුන්, මාධවන් සහ ටිරෝන් ආරම්භක ස්ථානයට ගියා.

එක පෙළට හිටගත්තා.

ආරම්භක සංඥාව නිකුත් වුණා.

අන්න හැමෝම එක පෙළට දුවනවා.

නිපුන් ඉදිරියෙන්.

ඊළඟට රෂීඩ්.

ටිරෝන් ළඟින් ම සංජය.

දුවනවා..... දුවනවා.....

හැමෝම වේගයෙන් දුවනවා.

"නිපුන් පළමුවෙනියා වෙයි නේද?"



“ අනේ අන්න නිපුන් වැටුණා,
නිපුන්ට රිදුණ ද දන්නෙ නෑ ”
අනෙක් අයත් නිපුන් ළඟ නැවතුණා.
අපිත් යමු. නිපුන්ට උදවු කරමු.
හැමෝම නිපුන් වට කර ගෙන.

මනුක දණහිස අතගානවා.
රෂීඩ් ඔළුව අතගානවා.
හොඳ යාළුවෝ.





“නිපුන් අපට පරාද වෙන්න බැහැ,

අපි ආයෙත් දුවමු.” රෂීඩ් කිවුවා.

රෂීඩ් හා මාධවන් නිපුන්ගේ අත් අල්ලා ගත්තා.

ක්‍රීඩා පිටියේ හැමෝම අත්පුඩි ගැහුවා.

නිපුන් එක්ක යාළුවෝ ඔක්කොම තරගය එකවර නිම කළා.

“අපි හැමෝම දිනුම්” සතුටින් කිවුවා.

# 6. වලාකුළේ



වලාකුළේ වලාකුළේ
කොයි යන්නේ හෙමින් සැරේ
මහ මුහුදින් වතුර ටිකක්
අර ගන්නයි මම යන්නේ



වලාකුළේ වලාකුළේ
වතුර අරන් කොහි යන්නේ
අපේ රටේ වැව් පුරවා
වැහි දෙන්නයි මම යන්නේ



වලාකුළේ වලාකුළේ
මොකට ද වැව් පුරවන්නේ
කුඹුරු වැඩට තාත්තාට
වතුර දෙන්න පුරවන්නේ

# 7. අලුත් නුවණ



දවසක් ගෝණෙක් වතුර බොන්න ගඟක් ළඟට ආවා. මේ ගෝණා තමන්ගේ රූපය කවදාවත් දැකලා තිබුණේ නෑ. එදා ගෝණා තමාගේ රූපය වතුරේ දැක්කා.

“මගේ අං තට්ටුව හරි ම ලස්සනයි, ශක්තිමත්.” ආඩම්බරයෙන් හිතුවා. ඒත් කකුල් නම් හරි ම හීනියි, හරි ම කැතයි කියලා ගෝණා දුක් වුණා.

කෑම හොයා ගෙන යන සිංහයෙක් ගඟ ළඟට ආවා. ගෝණා වතුර බොනවා දැක්කා. හෙමින් හෙමින් ගෝණාට ළං වුණා. ගෝණා හොඳට ම බය වුණා.





ගෝණා පණ බේරා ගන්න හයියෙන් දිවුවා. සිංහයා ගෝණා පස්සෙන් එළෙවුවා. එකපාරට ම ගෝණාගේ ලස්සන අං තට්ටුව අත්තක පැටලුණා. ගෝණාට දුවන්න බැරි වුණා.

සිංහයා ළඟ ළඟ ම එනවා ගෝණා දැක්කා. ගෝණා දඟලන්න පටන් ගත්තා . පැටලුණු අං තට්ටුව, එක කකුලක උදව්වෙන් බේරා ගත්තා. වේගයෙන් දුවලා සිංහයාගෙන් බේරුණා.



" අං තට්ටුව ලස්සනයි. ඒත් මගේ ජීවිතය බේරා දුන්නේ මගේ කකුල්." හති අරිමින් ගෝණා හිතුවා.

# 8. සෙල්ලම් ඉස්කෝලේ



අම්මාගේ සාරිය ඇඳ
අක්කාගේ බෑගය ගෙන
ටකුස් ටුකුස් සපත්තු දෙක
මං දාගන්නම්



පාට කුඩේ ඉහලා ගෙන
පොත් මිටියක් තුරුලට ගෙන
සෙල්ලම් ඉස්කෝලෙට යන
ගුරුතුමියයි මං

නංගි මල්ලි මෙහෙට එන්න
මේ පන්තියේ ඉගෙන ගන්න
ලියන්න කියවන්න අකුරු
කියලා දෙන්නම්

පොල් කොළයක් අතට අරන්
එහෙට නමා මෙහෙට නමා
රූං පෙත්ත හදනා හැටි
කියලා දෙන්නම්



ටිං බෙරයට තට්ටු දමා
තාල තියා පාද තබා
ලස්සන නැටුමක් නටන්න
කියලා දෙන්නම්



අම්මා තාත්තා අක්කා
ගෙදරට එන වෙලාව හරි
ආයුබොවන් සැම දෙනාට
නැවතත් එන්නම්

# 9. අපූරු තෑග්ග

“ මනුකගේ උපන් දිනය ලබන සිකුරාදා.

මනුකට තෑගි දෙන්නේ මොනවා ද?”

අම්මා ඇහුවා.

“ සෙල්ලම් බඩුවක් තෑගි දෙමු.” මල්ලි කිවුවා.

“ නෑ.. නෑ.. මනුක දැන් ටිකක් ලොකුයි.

අකුරු කියවන්නත් දන්නවා. ඒ නිසා කතන්දර පොත් තෑගි දෙමු.  එයා කතන්දර පොත් කියවන්න හරි ආසයි.”

අයියා කිවුවා.

“ඒක හොඳ අදහස. සෙල්ලම් කරනවා වගේ ම පොත් කියවන්නත් පුරුදු වෙන්න ඕනෑ. අපි කතන්දර පොත් තෑගි දෙමු.” තාත්තා කිවුවා.

කතන්දර පොත් ගන්න අපි පොත් කඩේට ගියා.

**හත්පණ, මඟුල් කෑම, හීන්සැරය** කතන්දර පොත් ගොඩයි.

" හත්පණ පොතේ මිල කීය ද?"

"රුපියල් අසූ පහයි."

කඩේ මාමා කිවුවා.

"මඟුල් කෑම පොත රුපියල් හැත්තෑවයි." අයියා පොතේ මිල බලලා කිවුවා.

"හීන්සැරය රුපියල් අනූවයි."

"මට ඕන හීන්සැරය පොතක් " අයියා කිවුවා.



අපි පොත් කීපයක් ගත්තා.
කඩේ මාමා බිල් පතක් දුන්නා.

| විස්තරය | රුපියල් | සත |
|---|---|---|
| හීන්සැරය | 90 | 00 |
| හත්පණ | 85 | 00 |
| මගුල්කෑම | 70 | 00 |
| කුමර ගී | 95 | 00 |
| එකතුව | 340 | 00 |

මනුකගේ උපන් දිනය ආවා.
කතන්දර පොත් තෑගි ලැබුණා.
මනුක හැම දෙනාට ම ස්තුති කළා.
ලැබුණු කතන්දර පොත් ආසාවෙන් කියෙවුවා.
මනුකට හරි ම සතුටුයි.



# 10. කඩදාසි මාළුවෙක් හදමු

ටිලිං ටිලිං ටිලිං........

විවේක කාලය නිමා වුණා. ළමයි හැමෝම පන්තියට ආවා. ගුරුතුමිය පන්තිය ඉදිරියේ සිට ගත්තා. ළමයි නිශ්ශබ්ද වුණා.

**දියේ ඉන්න මාළුවෝ**
**පුංචි අපේ යාළුවෝ**
**උඩ පැනිල්ල යට ගිලිල්ල**
**හැම තිස්සෙම ඇති නැටිල්ල**


ගුරුතුමිය ලස්සනට ගායනා කළා.

ළමයි අත්පුඩි ගසමින් ගුරුතුමිය සමග ගායනා කළා.


" අපිත් මාළුවෙක් හදමු. " ගුරුතුමිය කිවුවා.

හැම දෙනාට ම හරි හතරැස් කඩදාසි කොළය බැගින් ලැබුණා.


කොළය මේසය උඩින් තියන්න.




රූපයේ පෙනෙන ආකාරයට මුලු දෙක එක මත එක තබා ත්‍රිකෝණයක් වන සේ නවන්න.




ත්‍රිකෝණය මත රූපයේ දක්වා ඇති ආකාරයට හැඩය ඇඳ ගන්න.




ඇඳගත් හැඩය දිගේ කතුරෙන් කපා ගන්න.




කඩදාසිය දිග අරින්න.




පෙනෙන පරිදි කතිර දමා ඇති රේඛාව දිගේ එක පැත්තකින් පමණක් කපන්න.




කැපූ කොටස් දෙක දෙපැත්තට මාරු කරන්න.




දැන් අලවා ගන්න.




මාළුවාගේ ඇස්, කට, වරල් ඇඳ පාට කර ගන්න.



ගුරුතුමිය බිත්තියේ නිල් පාට ලොකු පුවරුවක් එල්ලුවා. ළමයි පේළියට ගොස් ඔවුන් හැදූ මාළු, නිල් පාට පුවරුවේ ඇලෙව්වා. පාට පාට මාළු පිරුණු පුංචි පොකුණක් වගෙයි.



**දියේ ඉන්න මාළුවෝ**
**පුංචි අපේ යාළුවෝ**
**උඩ පැනිල්ල යට ගිලිල්ල**
**හැම තිස්සෙම ඇති නැටිල්ල**

ළමයි ගුරුතුමිය සමග නැවතත් ගායනා කළා.

## 11. තෝරාලා කිවුවොත් තරු ලකුණු ලැබෙන්නේ

1. මල් දැක එන්නේ
මලක් වගේ නේ
තටු නටවන්නේ
කවුද කියන්නේ

2. ගස් සොලවන්නේ
කොළ ගැලවෙන්නේ
වැස්සට පෙර මේ
කවුදැයි එන්නේ

3. සින්දු ගීත කවි කතා ඇසෙන්නේ
පාට පාට පින්තූර පෙනෙන්නේ
දැනුමයි සතුටයි අපට බෙදන්නේ
පිළිතුර දෙන අය තෑගි දිනන්නේ

4. කනේ නළාවෙන් පපුවේ සද්දෙ අහනවා
අතේ පුරුද්දෙන් ලෙඩ දුක් සොයා කියනවා
හිතේ කැමැත්තෙන් දෙන බෙහෙතුත් අපි බොනවා
කවුද කියා කිවුවොත් ඔබ හපනෙක් වෙනවා

5. සීනු හඬට උදේ ඉඳන් වැඩ අරඹන්නේ
පොත් මිටියයි රතු පෑනයි නැහැ වරදින්නේ
කළු ලෑල්ලේ සුදු පාටින් අකුරු ලියන්නේ
තෝරාලා කිවුවොත් තරු ලකුණු ලැබෙන්නේ



## 12. කතන්දරයක් කියවමු

"අම්මේ මට කතන්දරයක් කියා දෙන්න."

මනුක අම්මාට කිවුවා.

"කෝ පුතාගේ උපන් දිනේට ලැබුණු කතා පොත්?

අපි ඒ පොතක කතන්දරයක් කියවමු ද?"

මනුක පොතක් තෝරා ගත්තා.



‘රන් කුඹලා’

අම්මා පොත කියවන්න ගත්තා.

සවිඳු පුංචි ළමයෙක්.

එයා අලුත් ගෙදරක ජීවත් වුණා.

අම්මයි, තාත්තයි, නංගියි, අත්තම්මයි එක්ක සවිඳු ඒ ගෙදර හරි සතුටින් හිටියා.

සවිඳුට පාඩම් කරන්න අලුත් මේසයක් අලුත් පුටුවක්...

මේසය තියෙන්නේ ජනේලය ළඟ.

එතැනට ලස්සනට අහස පෙනෙනවා.

එක පාරට ම ගේ ඇතුළෙන් ‘රූං’ ගාන සද්දයක් ආවා. සවිඳු වටපිට බැලුවා. පුංචි ම පුංචි සතෙක් අහස් යානයක් වගේ රූං ගාලා ඉගිළුණා.

සවිඳු කැරකි කැරකි උඩ බැලුවා.

රන් කුඹලෙක්

රන් කුඹලා දොර උළුවස්ස පැත්තට ගියා.

උළුවස්සේ පුංචි මැටි ගුළියක්.

මැටි ගුළිය ඇතුළට රන් කුඹලා රිංගුවා.

ඒක රන් කුඹලාගේ ගෙදර.

රන් කුඹලාගෙ ගේ දැක්කා ම සවිඳුට හරි පුදුමයි. බෝල බෝල මැටි ගෙනැත් හැදූ ලස්සන පුංචි ගෙයක්. සවිඳුගෙ අලුත් ගෙදරට අලුත් නෑයෙක්, අලුත් යාළුවෙක්.

රෑං ... රෑං ... රෑං ...

සවිඳුත් රෑං කිය කියා රන් කුඹලා දිහා බලාගෙන ඉන්නවා.

නිවාඩු දවසක තාත්තා ගේ පිරිසිදු කළා.

කොස්සක් අරන් මකුළු දැල් කැඩුවා.

"මේ මොකද මේ අලුත් ගෙදර කුඹල් ගෙයක් බැඳලා?"

තාත්තා කිවුවා.

"අනේ, තාත්තේ රන් කුඹලාගෙ ගේ කඩන්න නම් එපා.

අපි වගේ ම එයත් ගේ හදන්න මහන්සි වෙන්න ඇති."

අලුත් ගෙදර ඇතුළේ තවත් අලුත් ගෙයක්.

අම්මා කතන්දරය කියවා අවසන් කළා.

මනුක රන් කුඹලෙක් ඇන්දා.

පාට කළා.

කතන්දර පොත කියවන්න පටන් ගත්තා.



# 13. වවමු වවමු අපිත් වවමු

එදා නිවාඩු දවසක්.

රාධාත්, ෆාරාත්, තාරකත් මනුකගේ ගෙදර ගියා.

මනුකගේ ගෙදර හැමෝම යහළුවන් ආදරයෙන් පිළිගත්තා.

කතාබහ කළා.

නොදැනීම දවල් වුණා.


" පුතා, යාළුවොත් එක්ක එන්න කෑම කන්න."

" රාධා, ෆාරා, තාරක, යමු යමු කෑම කන්න."

හැම දෙනා ම අත් සෝදා ගත්තා.

කෑම කන්න වාඩි වුණා.

අම්මා හැමෝටම බත් බෙදුවා.





“කොළ සම්බෝලය හරි ම රසයි නැන්දේ.”

“මොනවද මේ කොළ?” රාධා ඇසුවා.

“මේ මුකුණුවැන්න.”

“ මුකුණුවැන්න සම්බෝලය මං අදමයි කෑවේ.”

“මේවා අපියි වගා කළේ.”

මනුක හරි සතුටෙන් කිවුවා.

“මනුකට වගා කරන්න ඉඩ තියෙනවා ද?

වත්තේ ඉඩක් නෑ නේ.”

“ කවීෂා, අපි කෑම කාලා ඉවර වෙලා යමු.

මං පෙන්වන්නම් අපේ පාත්ති.”

“ ලස්සන පුංචි ගෙවත්තක්” කවීෂා කිවුවා.

“ ඔව් පුතේ, පිළිවෙළකට වගා කළොත් පුංචි ඉඩක වුණත් වගා කරන්න පුළුවන්.” මනුකගේ තාත්තා කිවුවා.

“ අපේ තාත්තා තමයි, උඩ තට්ටුවේ වවමු කිවුවේ.”



“මනුක මේ මොනව ද?” ෆාරා ඇසුවා.

“මේ නිවිති, අර ගොටුකොළ, ඊට එහා පැත්තේ කංකුං. අර තියෙන්නේ සාරණ. ඊට මෙහා පැත්තේ මුකුණුවැන්න. පෝච්චිවල තියෙන්නේ වම්බටු, බණ්ඩක්කා වගේ එළවළු.” මනුක කියාගෙන කියාගෙන ගියා.

“රම්පෙ, කරපිංචා, අමු මිරිස් අපි කඩෙන් ගෙනෙන්නේ නැහැ.” තාත්තා කිවුවා.

“මටත් ආසයි අපේ වත්තේ වගා කරන්න.” ෆාරා කිවුවා.

“බොහොම හොඳයි දුව, මමත් එළවළු පැළ ටිකක් දෙන්නම්.”





# 14. අම්මා තාත්තා ඉර හඳ වාගේ

පුතා : අම්මේ අම්මේ අර කුරුලු කූඩුවෙන්
පුංචි හොටක් එළියට එනවා
බලන්නකෝ ඒ අම්මා තාත්තා
මොනවාදෝ කන්නට දෙනවා

අම්මා : අම්මා තාත්තා උදේ රැයින් දුර
ඉගිළී හවසට ගෙට එනවා
ගෙනා කෑම පැටවුන්ට කවා උන්
හරි සතුටින් නින්දට යනවා

පුතා : කුරුලු පැටවු මං වගේ ද අම්මේ
කෑම නොකා හැංගෙනවා ද?
මං වාගෙ ම උන් දෙමාපියන්හට
වැඳලා නින්දට යනවා ද?


අම්මා : කුරුලු පැටවු මගේ පුතා වගේ නැහැ
කෑමට කවදත් හොර වෙන්නේ
දෙමාපියන්හට නොවැන්දාට උන්
මව් තුරුලෙයි නින්දට යන්නේ

පුතා : කෑම නොකෑවට දෙමාපියන්ගේ
මහන්සියට මං දුක් වෙනවා
සමාවෙන්න මගේ අම්මේ මේ මං
අද ඉඳලා කෑමත් කනවා



අම්මා : පුතාගේ හොඳ වැඩ හොඳ ගති දැකලා
කුරුලු පැටවු අර හිනැහෙනවා
අම්මා තාත්තාගේ අගේ දන්න හොඳ
ළමයි කියා ගී මුමුණනවා

පුතා : හදා වඩා මට කවා පොවා ලොකු
කරන්න අම්මා වෙන වෙහෙස
උදේ හවා දහදියෙන් තෙමා ගත
තාත්තා නිවසට එයි හවස



**අම්මා** : පුතා දන්නේ නෑ මව්පියෝ කවුරුත්
දරුවන් හින්දා වෙන වෙහෙස
අපේ ලෝකයේ මැණික් පහන වෙන
කවුරුන්දෝ සුදු පුතා මිස

**පුතා** : අම්මා තාත්තා ඉර හඳ වාගේ
හැමදාමත් ලෝකයට මගේ
ආදරයෙන් ඉන්නට මං ආසයි
නිල් අහසේ තරුවක් වාගේ

**අම්මා** : අම්මා තාත්තාට වගේ ම කාටත්
ආදරයෙන් පුතු සලකනවා
කළගුණ දන්නා මගේ පුතා මතු
දවසක මේ ලොව බබළනවා



# 15. සතුටු චාරිකාව

අද අපේ ඉස්කෝලේ චාරිකාව.

අපි යන්නේ ග්‍රහලෝකාගාරය බලන්න.

ළමයි හැමෝම බස් රථයට නැග්ගා.

" ඔළුව එළියට දාන්න එපා.

අත් එළියට දාන්න එපා."

ගුරුතුමිය ළමයින්ට අවවාද කළා.

බස් රථය ගමන ඇරඹුවා.

හැමෝම හිටියේ හරි ම සතුටින්.

සින්දු කියන්න, අත්පුඩි ගහන්න පටන් ගත්තා.

බයිසිකල්, කාර්, ත්‍රීරෝද රථ පසු කර බස් රථය ඉදිරියට ම ගියා.

" අන්න ග්‍රහලෝකාගාරය,"

ගුරුතුමිය පෙන්නුවා.

ඔටුන්නක් වගේ ගොඩනැගිල්ලක් ඈතින් පෙනුණා.

“බස් එක නවත්වන්න, නවත්වන්න.” ළමයි කෑගැසුවා.

“මෙතන නවත්වන්න තහනම් පුතේ.

අර බලන්න අර පුවරුව,

ඒ පුවරුවෙන් කියවෙන්නේ වාහන නවත්වන්න එපා කියලයි.”




බස් රථය තරමක් ඉදිරියෙන් නතර කළා.

“දැන් දෙන්නා දෙන්නා පේළියට එන්න.”

ගුරුතුමිය ළමයින් එක්ක කහ ඉර හරහා පාර මාරු වුණා.

ටිකක් දුර ගිහින් ග්‍රහලෝකාගාරයට ඇතුළු වුණා.

ග්‍රහලෝකාගාරයේ චිත්‍රපට ශාලාවක වගේ පුටු තිබුණා.

ළමයි නිශ්ශබ්දව වාඩි වුණා.



ග්‍රහලෝකාගාර අහසේ චිත්‍රපටියක් දර්ශනය වුණා.

ළමයි ඒ දිහා බලා ගෙන ම හිටියා.

විශාල ශබ්දයක් සමග අමුතු ම අමුතු යානයක්.

ඒක ඈත ම ඈත දුර අහසට ම ගියා.

ඒක නම් අහස් යානයක් වෙන්න බැහැ.

රොකට් එකක් වගේ.

හඳට ගියේ ඒ වගේ යානයකින් කියලා ගුරුතුමිය කියා දීලා තිබුණා.

අමුතු ම ඇඳුමක් ඇඳගත් මාමා කෙනෙක් හඳට ගිය හැටි පෙන්නුවා.

ඒ මාමා හඳ උඩ ඇවිද්දා.

හඳේ ඉඳන් පොළොවට කතා කළා.

ඉර, හඳ, තරු පොකුරු, වල්ගා තරු, ග්‍රහලෝක වගේ අහසේ පෙනෙන දේවල් ග්‍රහලෝකාගාර අහසේ පැහැදිලිව පෙනුණා.

අහසේ ඉර පායා ගෙන එද්දී ශාලාව එළිය වුණා.
ළමයි ග්‍රහලෝකාගාරයෙන් එළියට ආවේ දුර ගමනක් ගිහින් ආවා වගේ.
හැමෝට ම බඩගිනි වෙලා.
"අපි දවල් කෑම ගන්න සතුටු උයනට යමු." ගුරුතුමිය කිවුවා.
හැමෝම බස් එකට නැග්ගා.



බස් එක සතුටු උයන ළඟ නතර කළා.

ළමයි කෑම පෙට්ටි, වතුර බෝතල් අරන් බස් එකෙන් බැස්සා.

"කවුරුවත් තනියම ඈතට යන්න එපා."

ගුරුතුමියගේ හඬ පැහැදිලිව ඇසුණා.

කෑමෙන් පස්සේ ළමයි පුංචි කෝච්චියේ සවාරියක් ගියා.

හරි ම විනෝදයි.

ළමයි සතුටින් සෙල්ලම් කළා.



"දැන් ඉතින් බස් එකට නගින්න." ගුරුතුමිය කිවුවා.

හැමෝම නැග්ගට පස්සේ බස් එක පිටත් වුණා.

ළමයි ගී ගයමින් විනෝද වුණා. බසය පාසලට එන විට තරමක් රෑ බෝ වෙලා. ළමයින්ට මේ චාරිකාව කවදාවත් අමතක වුණේ නෑ.

# ගුරු උපදෙස්

කියවීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. කියවීමේ දී, ඇස, අත, මුව, කන, මනස යන ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක වේ. මෙහි දී අකුරු හඳුනා ගැනීම, අකුරු හඳුනා ගෙන ශබ්ද කිරීම, අකුරු එකතු කර වචන හා වාක්‍ය කියවීම ඉතා සංකීර්ණ ඉගෙනුම් ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එහෙත් වඩා වැදගත් වන්නේ කියවා යමක් අවබෝධ කර ගැනීම යි. ඒ සඳහා මනා පුහුණුවක් ලැබිය යුතු ය.

ඒ සඳහා මෙම කියවීම් පොත මනා පිටිවහලක් වනු ඇත. මීට අමතරව ශ්‍රේණියට අදාළ කතන්දර පොත් කියවීම ද ශිෂ්‍යයන්ගේ කියවීම සංවර්ධනයට උපකාරී වේ.

එහි ඇතුළත් පාඩම් 15 පහත වගුවේ දැක්වෙන ආකාරයට නිපුණතාව හා විෂය අන්තර්ගතය සමග මූලික වශයෙන් බැඳී පවතී. එහෙත් සමහර පාඩම් නිපුණතා කීපයක් හා සමෝධානය වී තිබෙන බව ගුරුවරයා තේරුම් ගත යුතු වේ.

| පාඩම | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1<br>වැව් ඉවුරේ සංගීත පන්තිය | • කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි. | • පිල්ලම් සහිත අකුරු එකතු කර වචන කියවීම<br>• පිල්ලම් සහිත සරල වාක්‍යාංශ කියවීම<br>• පිල්ලම් සහිත සරල වැකි කියවීම<br>▪ නැවතීමේ ලකුණට අනුගතව කියවීම |
| 2<br>ළමයා සහ තාරකා<br><br>ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ පද්‍ය නිර්මාණයකි. | • කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.<br>• කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.<br>• අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලීව සහ අවස්ථෝචිතව කියවයි. | • පිල්ලම් සහිත සරල වාක්‍යාංශ කියවීම<br>• පිල්ලම් සහිත සරල වැකි කියවීම<br>• අකුරු දෙකේ වචන<br>▪ අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන<br>• ළමා ගීත |
| 3<br>නිධානය<br><br>ජන කතාවක් ඇසුරෙනි. | • අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලීව සහ අවස්ථෝචිතව කියවයි. | • ළමා කතන්දර<br>• දෙබස්<br>• ළමා කතන්දර පොත් |

| | | |
|---|---|---|
| 4<br>ඔංචිලි පදිමු | • භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කියවයි. | • ජන ක්‍රීඩා<br>• උත්සව |
| 5<br>හැමෝම දිනුම් | • භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කියවයි.<br>• එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි. | • උත්සව<br>• නිවේදන |
| 6<br>වලාකුළේ<br><br>ජයලත් මනෝරත්න මහතාගේ පද්‍ය නිර්මාණයකි. ගී සින්දු කෘතියෙන් උපුටා ගන්නා ලදි. | • කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි. | • ළමා කවි/ ගීත<br>• ඇඟිලි රූකඩ දෙබස් |
| 7<br>අලුත් නුවණ<br><br>ඊසොප්ගේ උපමා කතාවක් ඇසුරෙනි. | • අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලිව සහ අවස්ථෝචිතව කියවයි. | • ළමා කතන්දර<br>• ළමා කතන්දර පොත් |
| 8<br>සෙල්ලම් ඉස්කෝලේ | • එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි.<br>• සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි. | • පාසල හා නිවස සම්බන්ධ<br>  ▪ උපදෙස්<br>  ▪ තොරතුරු<br>  ▪ තමා පිළිබඳ විස්තර<br>• මාතෘකාවට අනුව විස්තර කිරීම<br>• විරුද්ධාර්ථ පද<br>• ගැහැනු පිරිමි හඟවන පද |
| 9<br>අපූරු තෑග්ග | • සන්නිවේදනය සඳහා කියවයි. | • මිල ගණන්<br>• ලේබල්<br>• දෙබස් |
| 10<br>කඩදාසි මාළුවෙක් හදමු | • එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි.<br>• සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි/ ලියයි. | • විධාන හා උපදෙස්<br>• හිස්තැන් පිරවීම<br>• හරි වැරදි යෙදීම |
| 11<br>තෝරාලා කිවුවොත් තරු ලකුණු ලැබෙන්නේ | • වාං මාලා සංවර්ධනය සඳහා කියවයි.<br>• සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි/ ලියයි. | • තේරවිලි<br>• හිස්තැන් පිරවීම<br>• හරි වැරදි යෙදීම |

| | | |
|---|---|---|
| 12<br>කතන්දරයක් කියවමු | • කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.<br>• අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලීව සහ අවස්ථෝචිතව කියවයි. | • ළමා කතන්දර<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• ළමා කතන්දර පොත් |
| 13<br>වවමු වවමු අපිත් වවමු | • එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි. | • පාසල හා නිවස සම්බන්ධව<br>■ උපදෙස්<br>■ තොරතුරු<br>■ තමා පිළිබඳ විස්තර |
| 14<br>අම්මා තාත්තා ඉර හඳ වාගේ | • කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.<br>• අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලිව සහ අවස්ථෝචිතව කියවයි.<br>• සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි. | • ළමා කවි/ ගීත<br>• ඇඟිලි රූකඩ දෙබස්<br>• ළමා ගීත<br>• දෙබස්<br>• පින්තූර කතා<br>• සමානාර්ථ පද<br>• ගැහැනු පිරිමි හඟවන පද<br>• ඒක වචන, බහු වචන පද |
| 15<br>සතුටු චාරිකාව | • වාං මාලා සංවර්ධනය සඳහා කියවයි.<br>• ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි. | • සංකේත<br>• කියවන විට ලිවීම<br>• අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගී වූ අවස්ථා |

වැව් ඉවුරේ සංගීත පන්තිය පාඩමෙන් පරිසරයට ආදරය කිරීම, සොබා දහමේ අසිරිය විඳ ගනිමින් කියවීමට හුරු වීම මෙන් ම 'ච්' 'වු' 'ං' 'න්' අක්ෂර නිවැරදිව භාවිත කර ලිවීමට හුරු කිරීම බලාපොරොත්තු වේ.

ළමයා සහ තාරකා පාඩමෙන් සොබා දහමේ චමත්කාරය කෙරෙහි ළමා සිත නැඹුරු කරවීමත්, රිද්මයකට අනුව ගායනයට යොමු කර වින්දනය ලබා දීමත් අරමුණු වේ.

නිධානය පාඩමෙන් අලස බව දුර ලා කඩිසරව තම කටයුතුවල යෙදීමේ පුරුද්ද ළමා සිත් තුළ ජනිත කරවීම අපේක්ෂා කෙරේ.

ඔංචිලි පදිමු පාඩමෙන් සාමය, සමගිය, එකිනෙකාට උදවු කිරීම, බෙදා හදා ගැනීම වැනි යහපත් ගුණාංග වර්ධනය කිරීම මෙන් ම ශ්‍රී ලාංකේය සංස්කෘතිකාංග පිළිබඳව දැනුවත් කිරීම බලාපොරොත්තු වේ.

හැමෝම දිනුම් ආකල්ප වර්ධනය මූලික කර ගෙන ලියන ලද පාඩමකි. විවිධ ජාතීන් එක්ව සමගියෙන්, සාමයෙන් හා සම අවස්ථා ලබා ගනිමින් කටයුතුවල යෙදීම මූලික අරමුණු වේ.

වලාකුළේ ගීත පෙළ, කියවා රස විඳීමටත් පරිසරය පිළිබඳ අවබෝධය වැඩි කිරීමටත් විද්‍යාත්මක සංකල්ප සාධනය කිරීමේ අත්තිවාරමක් ලෙසත් ලියා තිබේ.

අලුත් නුවණ පාඩමෙන් අදහස් වන්නේ ළමා සිත් තුළ නිරහංකාර වීමේ අගයත්, නිවැරදි අවබෝධයේ වටිනාකම පෙන්වා දීමත් ය.

සෙල්ලම් ඉස්කෝලේ පන්ති කාමරය තුළ, සෙල්ලම් මිදුලේ, සෙල්ලම් ගෙදර හෝ පාසල් වත්තේ කළ හැකි ක්‍රියාකාරකමකි. වාං මාලා පෝෂණය, විවිධ චරිත අනුකරණය, මෙන් ම ආචාරශීලී කතා බහ වැනි හොඳ ගුණාංග දරුවා තුළ ඇති කරවීම බලාපොරොත්තු වේ.

කියවීමට රුචිකත්වය ඇති කරවීමේ අරමුණින් පොත් සපයා ගැනීමට උනන්දුවක් ඇති කරලීම අපූරු තෑග්ග පාඩමෙන් අපේක්ෂා කෙරේ.

අවධානයෙන් සවන්දීම, අනුපිළිවෙළ හුරු කිරීම, අන්‍යයන්ට උදවු කිරීම, නිර්මාණශීලි බව ඇති කිරීම මෙන් ම නව නිර්මාණ බිහි කිරීමට සිසු සිත් පෙලඹවීම කඩදාසි මාළුවෙක් හදමු පාඩමේ අරමුණු වේ.

වින්දනයක් ලැබීමත් සමග චින්තන ශක්තිය වර්ධනය කිරීමේ අරමුණින් තෝරාලා කිවුවොත් තරු ලකුණු ලැබෙන්නේ පාඩම ලියා ඇත.

කතන්දරයක් කියවමු පාඩමෙන් බලාපොරොත්තු වන්නේ පොත් කියවීමේ උනන්දුව වැඩි දියුණු කිරීම ය.

වවමු වවමු. අපිත් වවමු. පාඩම අවසානයේ සෑම දරුවෙක් තුළ ම ගෙවත්තක් සැකසීමට උනන්දුව ඇති කරලීම මූලික අරමුණ වේ.

අම්මා තාත්තා ඉර හඳ වාගේ පාඩමෙන් දෙමාපියන්ගේ අගය, දෙමාපියන්ට, වැඩිහිටියන්ට සැලකීම, ගෞරව කිරීම වැනි සාරධර්ම වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. මෙය 'මොනවද අම්මේ අකුරු ජාතියක් මල් පෙතිවල කවුදෝ ලියලා' ගීයේ තාලයට ගායනා කළ හැකි ය.

සතුටු චාරිකාව පාඩමෙන් වින්දනය, දැනුම ලබා ගැනීම, පරිසරය හඳුනා ගැනීම, මාර්ග සංඥා පිළිබඳ අවබෝධය, මෙන් ම සියලු පිල්ලම් අන්තර්ගත වචන කියවීම ද බලාපොරොත්තු වේ.